ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.12.16

පී. ඒ පුෂ්ප කුමාර මයා
නො. 9/ඩී,
පල්ලේගම,
කෝට්ටගොඩ,
බදුල්ල.

*පැමිණිලි පාර්ශවය*

එදිරිව

01. ඩී. එම්. පී.කේ. දසනායක මයා
ප්‍රධාන පොලිස් පරීක්ෂක
පොලිස් ස්ථානය, මාවතගම.

02. නිශාන්ත හෙට්ටිආරච්චි මයා
ප්‍රධාන පොලිස් පරීක්ෂක,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, මාවතගම.

*වගඋත්තර පාර්ශවය*

**පැමිණිලි අංකය : HRC/HO/2547/24**

ඉහත නම් සඳහන් පැමිණිලිකරු විසින් 2024.06.26 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පහත පරිදි පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. තමා කටුනායක ප්‍රදේශයේ ඇඟලුම් කර්මාන්ත ශාලාවක තාක්ෂණික නිලධාරියකු වශයෙන් සේවය කරන අවිවාහක තැනැත්තෙකු බවත්, වැල්ලවත්ත කන්‍යාරාමයේ ගුරුවරියක ලෙස සේවය කළ කරන ක්‍රිෂාන්ති නෙලූනිකා විජේරත්න යන තැනැත්තිය සමඟ 2020 මැයි මස මුල් භාගයේදී පමණ ප්‍රේම සම්බන්ධතාවයක් පැවැත් වූ බවත් සඳහන් කර ඇත. අවුරුදු තුනකට ආසන්න කාලයක් එකී තැනැත්තිය සමඟ ප්‍රේම සම්බන්ධතාවය පැවතුණු බවත්, 2024 ජනවාරි මස හෝ ඊට ආසන්න කාලයකදී තමන් දෙදෙනා අතර ඇති වූ පුද්ගලික ගැටලුකාරී තත්ත්වයක් හේතුවෙන් එම සබඳතාවය නවතා දැමූ බවත් ප්‍රකාශ කර ඇත. එකී සම්බන්ධතාවය නවතා දැමීමෙන් පසු එම තැනැත්තිය විසින් තමාගේ දුරකථන අංකය අවහිර කරනු ලැබූ බැවින් ඇය සමඟ දුරකථනයෙන්

සම්බන්ධ වීමේ හැකියාව ද තමාට නොතිබුණු බව සඳහන් කර ඇත. තමා 2024.04.19 දින මහනුවර දළදා මාලිගය වැඳගැනීමට ගිය අවස්ථාවේදී ඉහත කී තමාගේ හිටපු පෙම්වතියගේ ඥාති සොහොයුරියක යැයි කියනු ලබන මාවතගම අක්කා නැමති කාන්තාව මුණගැසී, තමාගේ හිටපු පෙම්වතිය මානසික අගතිදායක තත්ත්වයකට පත්ව ඇති බවත්, එබැවින් එදින ඇයව හමුවීමට මාවතකම පිහිටි ඇයගේ ඥාති සොහොයුරෙකුගේ නිවසට පැමිණෙන ලෙසට එම ඥාති සොහොයුරිය විසින් තමාට ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. තමා එම ඥාති සොහොයුරියගේ ඉල්ලීම පරිදි එම කාන්තාවත් සමග තමාගේ හිටපු පෙම්වතිය නැවතී සිටින ඇයගේ ඥාති සොහොයුරාගේ නිවසට ගිය අවස්ථාවේදී, එම නිවසේ තවත් පුද්ගලයන් හත් දෙනකු පමණ සිටි බවත්, එකී පිරිස තමාගේ හිටපු පෙම්වතිය විවාහ කර ගන්නා ලෙස තමාට තර්ජනය කළ බවත්, එදිනම එනම් 2024.07.19 දින තමාට තමාගේ හිටපු පෙම්වතිය සමග විවාහය ලියාපදිංචි කරන ලෙසට තර්ජනය කරමින් දැඩි බලපෑම් කළ බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී එහි සිටි ඥාතීන් පිරිස බලහත්කාරයෙන් තමා මාවතගම පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් සඳහන් කර ඇත. එහිදී මාවතගම පොලිසි ස්ථානයේ එදින වැඩ බලන ස්ථානාධිපති ලෙස රාජකාරී කටයුතු කළ පළමුවන වගඋත්තරකරු වන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩී. එම්. පී. කේ. දසනායක නිලධාරියාගේ උපදෙස් මත, තමා රැගෙන පැමිණි ඥාති පාර්ශ්වයේ පස් දෙනාකුට වඩා වැඩි දෙනෙකුගෙන් යුත් පිරිසක ගෙන් ප්‍රකාශ සටහන් කරවා ගත් බවත්, තමා නිවසට නොයවා පොලිස් ස්ථානයේ එදින රඳවා තබා ගන්නා ලද බවත් සඳහන් කර ඇත. තමා රඳවා ගනු ලබන්නේ ඇයි දැයි එම නිලධාරියාගෙන් තමා විමසූ විට තමාගෙන් ප්‍රකාශයක් ලබා ගත් පසුව තමා නිවසට යවන බවට ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩී. එම්. පී. කේ. දසනායක නිලධාරියා ප්‍රකාශ කළ නමුත් තමාගේ ප්‍රකාශය ලබා ගැනීමෙන් පසුව අහේතුකව තමා පොලිස් ස්ථානයේ රඳවා තබා ගත් බවත් ප්‍රකාශ කර ඇත. පසුදින එනම් 2024.04.20 දින උදෑසන 10.00 ට පමණ තමාගේ හිටපු පෙම්වතිය සමඟ තවත් පිරිසක් පොලිස් ස්ථානයට පැමිණ පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයට ප්‍රකාශයක් ලබා දුන් බවත් එහිදී එහි සිටි පොලිස් නිලධාරිනිය විසින් දෙපාර්ශවය අතර මෙම ගැටලුව සමථ වූ බව පවසා තමා ඇතුළු සියලු දෙනාට පොලිසි ස්ථානයෙන් පිටව යන ලෙසට උපදෙස් ලබා දෙන ලද බවත් සඳහන් කර ඇත. එහෙත් එම ස්ථානයට එම අවස්ථාවේදී පැමිණි ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩී. එම්. පී. කේ. දසනායක නිලධාරියා විසින් පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා පැමිණෙන තෙක් තමා පොලිසි ස්ථානයේ රැඳී සිටිය යුතු බවට ප්‍රකාශ කළ බවත්, තමා එසේ රඳවා ගැනීමට හේතුව විමසූ විට එම නිලධාරියා තමාට අසභ්‍ය වචනයෙන් බැණ වැදුණු බවත් ප්‍රකාශ කර ඇත. එදින එනම් 2024.04.20 දින එකී පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වන දෙවන වගඋත්තරකරු ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත හෙට්ටිආරච්චි මහතාගේ උපන්දිනය යෙදී තිබුණු බැවින්, අනෙකුත් නිලධාරීන් එක්ව පොලිසි ස්ථානය බැලූන් හා රිබන් පටි යනාදියෙන් සරසන ලද බවත්, ස්ථානාධිපතිවරයා 2024.04.20 දින සවස 2.00 ට පමණ පොලිස් ස්ථානයට වාර්තා කිරීමෙන් අනතුරුව තමා අසලට පැමිණ තොරතුරු විමසූ බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී තමාට සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් තමා ස්ථානාධිපතිතුමා වෙත දන්වා අහේතුකව තමා රඳවා තබා ගැනීම අසාධාරණ ක්‍රියාවක් බව දැන්වූ බවත්, තමාට දුරකථන ඇමතුමක් ලබාගැනීමට අවසර ලබාදෙන ලෙසට ඉල්ලා සිටි බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී ස්ථානාධිපතිවරයා විසින් ඉතා දරුණු ලෙස අසභ්‍ය වචනයෙන් තමාට බැණ වදිමින් තමා සිරමැදිරියට

දමන ලෙසට පොලිස් ස්ථානයේ නිලධාරියකුට උපදෙස් ලබා දුන් බවත්, එදින රාත්‍රී ද එනම් 2024.04.20 දින රාත්‍රියේ තමාට පොලිසි ස්ථානය තුළ සිටීමට සිදුවූ බවත් ප්‍රකාශ කර ඇත. පසු දින එනම් 2024.04.21 දින තමා පිලැස්ස ගරු මහේස්ත්‍රාත්වරිය වෙත ඉදිරියට ඉදිරිපත් කළ බවත්, පළමුවන වගඋත්තරකරු වන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩී. එම්. පී. කේ. දසනායක නිලධාරියා තමා පොලිස් ස්ථානයේ දින දෙකක් සිටි බව දැන දැනම ගරු අධිකරණයට අසත්‍ය කරුණු වාර්තා කරමින් තමා 2024.04.20 දින රාත්‍රියේ මාවතගම නගරයේ සැක කටයුතු ලෙස සැරිසැරු බවට බී වාර්තාවක් ගොනුකරනු ලැබූ බව සඳහන් කර ඇත. එම අවස්ථාවේදී තමාට නීතිඥයෙකුගේ සහය ලබා ගැනීමට තමා සන්තකයේ මුදල් නොතිබූ බැවින්, අධිකරණ පරිශ්‍රයේ සිට නීතිඥ ඒකනායක මහතා මුදල් රහිතව තමා වෙනුවෙන් පෙනී සිටිමින් කරුණු දැක්වූ බවත් ගරු මහේස්ත්‍රාත්තුමිය විසින් තමාට ඇප ලබා දුන් නමුත්, නිසි ඇපකරුවකු නොමැතිවීම හේතුවෙන් දින හයක් තමාට බන්ධනාගාර ගතවීමට සිදුවූ බවත් ප්‍රකාශ කර ඇත. නැවත 2025.05.27 දින නඩුව විවෘත අධිකරණයේ කැඳවූ පසු තමාගේ නීතිඥ මහතා වන නීතිඥ ඒකනායක මහතා කරුණු දැකීමෙන් අනතුරුව සියලු කරුණු අවබෝධ කරගත් ගරු මහේස්ත්‍රාත්තුමිය විසින් තමා නඩු කටයුත්තෙන් නිදහස් කරන ලද බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව මෙම පැමිණිල්ලේ දක්වා ඇති පළමු හා දෙවන වගඋත්තරකරුවන් විසින් තමාගේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් කටයුතු කර ඇති බවත් ඒ සඳහා තමාට සාධාරණයක් ඉටුකරදෙන මෙන් මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉහත පැමිණිල්ල විභාග කිරීම සඳහා 2024.08.01 දින දෙපාර්ශවයම කොමිෂන් සභාව වෙත කැඳවන ලදි. එදින පැමිණිලිකරු පෙනී නොසිටි අතර, කැඳවීමේ සිතාසිය තමාට නොලැබුණු බව පැමිණිලිකරු වෙතින් විමසීමේදී පසුව ප්‍රකාශ කරන ලදි. 2024.08.01 දින පැමිණිල්ල විභාගය සඳහා පළමු හා දෙවන වගඋත්තරකරුවන් කැඳවා සිටිය ද දෙවන වගඋත්තරකරු වන ස්ථානාධිපති (මාවතගම පොලිස් ස්ථානය) පැමිණ නොසිටි අතර, පළමුවන වගඋත්තරකරු වන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩී. එම්. පී.කේ. දසනායක නිලධාරියා එදින කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් ප්‍රකාශයක් ලබාදී ඇත. නැවත මෙකී පැමිණිල්ල 2025.01.16 දින කොමිෂන් සභාව විසින් විභාගයට ගන්නා ලද අතර, එදින දෙපාර්ශවයම විභාගයට සහභාගී වී ඇත. එදින වගඋත්තර පාර්ශවය වෙතින් ලබාගන්නා ලද ප්‍රකාශ පහතින් ඉදිරිපත් කර ඇත.

**පළමුවන වගඋත්තරකරු - ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩී. එම්. පී. කේ. දසනායක මයා (මාවතගම පොලිස් ස්ථානය)**

තමා මාවතගම පොලිස් ස්ථානයේ සේවය කරනු ලබන බවත්, එකී පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස සේවය කරනු ලබන ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත හෙට්ටිආරච්චි මහතා 2024.04.19 දින නිවාඩු ලබා සිටි බැවින් තමා එදින පොලිස් ස්ථානයේ වැඩ බලන ස්ථානාධිපති ලෙස රාජකාරී කටයුතු සිදු කළ බවත් සඳහන් කර ඇත. 2024.04.19 වන දින රාත්‍රී පැය 23.45 ට පමණ පවුල් හා භාණ්ඩ ආරවුලක් සම්බන්ධ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම සඳහා පිරිසක් පොලිස් ස්ථානයට පැමිණි සිටින බවට

එදින රාත්‍රී උපසේවක රාජකාරියේ නියුතුව සිටි පොලිස් සැරයන් 46478 නවරත්න නිලධාරියා විසින් තමාට දැනුම්දුන් බවත්, එම අවස්ථාවේදී තමා පොලිස් බැරැක්කයේ රැඳී සිටි බවත් ප්‍රකාශ කර ඇත. පොලිස් සැරයන් 4648 නවරත්න නිලධාරියා විසින් එකී පැමිණිල්ල සම්බන්ධයෙන් සිදු කළ යුත්තේ කුමක්ද යන්න සම්බන්ධයෙන් තමාගෙන් උපදෙස් ඉල්ලා සිටි අවස්ථාවේ, තමා උප සේවක නිලධාරියා සමඟ චෝදනාගාරයට පැමිණ, පවුල් ආරවුල සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට පැමිණ සිටි පැමිණිලිකාරියගෙන් තමා විස්තර විමසා සිටි බවත් ප්‍රකාශ කර ඇත. පසුව තමා උපසේවක නිලධාරියාට එකී පැමිණිල්ල සටහන් කර ගන්නා ලෙසත්, පැමිණිලිකාරිය සමග පැමිණි අනෙක් පුද්ගලයන්ගේ ප්‍රකාශ සාක්ෂි වශයෙන් සටහන් කර ගන්නා ලෙසත් දැනුම්දුන් බව ප්‍රකාශ කර ඇත. තවද මෙකී පවුල් ආරවුල සම්බන්ධ පැමිණිල්ලෙහි විත්ති පාර්ශවය පිළිබඳ විමසීමේදී අදාළ විත්තිකරු එම පිරිස සමග පැමිණි බවත්, ඔහු ඔවුන් පැමිණි වෑන් රථයේ සිටින බව තමාට ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. පසුව තමා මෙම පැමිණිල්ල පවුල් ආරවුලක් සම්බන්ධ ගැටලුවක් වන බැවින් එය විභාග කිරීමට තමාට නොහැකි බවත්, ළමා හා කාන්තා කාර්යාංශ විසින් එය විභාග කළ යුතු බවත්, ඒ සඳහා හෙට දින එනම් 2024.04.20 දින ළමා හා කාන්තා කාර්යාංශයට පැමිණ එම අංශයේ ස්ථානාධිපති හමුවන ලෙස එම පිරිසට දැනුම්දී තමා නැවතත් බැරැක්කය වෙත ගිය බවත් ප්‍රකාශ කර ඇත. එහෙත් තමා කිසිදු අවස්ථාවක එකී පවුල් ආරවුල් සම්බන්ධ පැමිණිල්ලේ විත්තිකාර පාර්ශවය එනම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ල ඉදිරිපත් කර ඇති පැමිණිලිකරු නොදුටු බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. තමා ඊට පසුදා එනම් 2024.04.20 දින කුරුණෑගල වයඹ පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ නියෝග පරිදි, පොලිස් ස්ථානවල පිහිටුවා ඇති සිවිල් ආරක්ෂක කමිටුවල සාමාජිකයින් හඳුනා ගැනීම සහ උපදෙස් ලබාදීමේ සම්මන්ත්‍රණය සඳහා කුරුණෑගල මලියදේව විද්‍යාලය වෙත පෙ.ව. 8.46 ට පමණ පිටව ගිය බවත්, එසේ පිටව යන අවස්ථාවේදී පෙර දින රාත්‍රියේ පැමිණි පවුල් ආරවුල සම්බන්ධ පැමිණිල්ල විභාග කරන ලෙසට ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරිනියට තමා දැනුම්දුන් බවත් ප්‍රකාශ කර ඇත. තමා අදාළ සම්මන්ත්‍රණය අවසන්වී නැවත සවස පොලිස් ස්ථානයට පැමිණෙමින් සිටින විට මාවතගම නගරයෙහි බස් නැවතුම්පොළෙහි සැකකටයුතු පුද්ගලයෙකු සිටින බවට තමාගේ පුද්ගලික දුරකථනයට ඇමතුමක් තැබුණු බවත්, ඒ අනුව තමා එම ස්ථානයට ගොස් අදාළ සැකකාර පුද්ගලයාගෙන් ප්‍රශ්න කර ඔහුගෙන් ජාතික හැඳුනුම්පත ඉල්ලා සිටිය ද ඔහු සතුව හැඳුනුම්පත නොතිබූ බැවින් ඔහු පිළිබඳව සැකයක් මතුවී පැය 19.00 ට එම පුද්ගලයා අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට පැය 19.20 ට ඉදිරිපත් කළ බවත්, ඒ වන විට ඔහු සන්තකයේ කුඩා බෑගයක් සහ ජංගම දුරකථන හතරක්, රුපියල් 11000/- ක මුදලක් තිබූ බවත් සඳහන් කර ඇත. පසුව තමා විසින් සැකකරුගෙන් පැය 19.30 ට ප්‍රකාශයක් ලබාගත් බවත්, ඔහුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීමේදී මෙම අය එදින පවුල් ආරවුල සම්බන්ධයෙන් වූ පැමිණිල්ලෙහි විත්ති පාර්ශ්වය බව එම අවස්ථාවේදී තමා දැනගත් බවත් ප්‍රකාශ කර ඇත. පසුව ඔහුගේ ජාතික ඇඳුම්පත් අංකය ලබාගෙන එය වී. පී. එන්. ජාලයට ඇතුළත් කිරීමෙන් පසුව මොහුට විරුද්ධව විවිධ ප්‍රදේශවල අපරාධ සම්බන්ධයෙන් අධිකරණවලට ඉදිරිපත් කර ඇති බවට වාර්තා ලබා ගැනීමට හැකියාව ලැබුණු බව ප්‍රකාශ කර ඇත. එකී අපරාධ නඩු සම්බන්ධයෙන් මොහුට වරෙන්තු නිකුත්වී ඇද්ද යන සැකය මත 2024.04.21 දි සැකකරු පිලැස්ස මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමුකළ බව ප්‍රකාශ කරන ලදි. තවද ඔහුගේ ඇඟිලි සටහන් ලබාගෙන ඒවා

කොළඹ ඇඟිලි සලකුණු රෙජිස්ටර්වරයා වෙත යැවූ බවත් එම වාර්තාව පොලිස් ස්ථානය වෙත සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ලැබුණු බවත් සඳහන් කර ඇත. එකී වාර්තාවෙහි මොහුට විරුද්ධව අපරාධ සම්බන්ධයෙන් විවිධ ප්‍රදේශවල පැමිණිලි ඇති බවට සඳහන්ව් තිබූ බව ප්‍රකාශ කර ඇත. කෙසේනමුත් අධිකරණ විසින් සැකකරුට ඇප ලබාදුන්ද ඇප අත්සන් කිරීමට කිසිවෙකු නොසිටි බැවින් මොහුව රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට අධිකරණය විසින් නියෝග කළ බවත් ප්‍රකාශ කර ඇත. පසුව මෙම නඩුව 2024.05.27 දින කැඳවූ අවස්ථාවේදී මෙම සැකකරු සම්බන්ධයෙන් ලබා දුන් දුරකථන පණිවුඩ අනුව විවිධ පොලිස් ස්ථාන මගින් මෙම අය අපරාධවලට සම්බන්ධ නොමැති බවට වාර්තා ලබා ගැනීමෙන් පසුව ඒ පිළිබඳව ගරු අධිකරණය වෙත දැනුම් දුන් පසු සැකකරු නිදහස් කරනු ලැබූ බව ප්‍රකාශ කර ඇත.

**දෙවන වගඋත්තරකරු - ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත හෙට්ටිආරච්චි මයා (ස්ථානාධිපති - මාවතගම පොලිස් ස්ථානය)**

තමා මාවතගම පොලිසි ස්ථානයේ ස්ථානාධිපති ලෙස කටයුතු කරන බවත් 2024.04.16 දින පැය 15.00 ට හිලව් නිවාඩු දිනයක් ලබාගෙන තමාගේ මාතලේ පිහිටි නිවසට පිටත්ව ගිය බවත් තමා නැවත නිවාඩුව අවසන් කර 2024.04.22 දින පැය 6.10 ට නිල වශයෙන් රාජකාරියට වාර්තා කළ බවත් ප්‍රකාශ කර ඇත. තමා නිවාඩු ලබාගෙන සිටි කාලය තුළ එනම් 2024.04.20 දින පොලිස් ස්ථානයේ සහෝදර නිලධාරීන් විසින් තමාගේ උපන්දිනය වෙනුවෙන් සැමරීමක් සූදානම් කර තමාට පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස ආරාධනා කරනු ලැබූ බැවින් තමන් 2024.04.20 දින පෙ.ව. 11.00 ට පැමිණ තමාගේ බිරිඳ, පුතා සහ දියණිය සමග පොලිස ස්ථානයට පැමිණි බව ප්‍රකාශ කර ඇත. තමාගේ කාර්යාලයේ ඇතුළත කාමරයේ උපන්දින කේක් එකක් නිලධාරීන් විසින් සකස් කර තිබූ බවත් එම නිලධාරීන් සමඟ කේක් එක කපා තමාට සුභ පැතීමෙන් පසු තමා පොලිසි ස්ථානයෙන් පෙ.ව. 11.20 ට පමණ පොලිස් ස්ථානයෙන් පිටව ගිය බවත් ප්‍රකාශ කර ඇත. මෙම පැමිණිල්ලේ විෂයගත කරුණ සම්බන්ධයෙන් තමා පසුව දැනගත් බවත්, තමා නිවාඩු සිටි කාලය තුළ වැඩ බලන ස්ථානාධිපති ලෙස කටයුතු කළ ප්‍රධාන පොලිස් පරීක්ෂක දසානායක මහතා ඇතුළු නිලධාරීන් විසින් සැකපිට ප්‍රශ්න කිරීමට පුද්ගලයකු අත්අඩංගුවට ගෙන ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු එම සැකකරුට ඇප ලබාදීමට පුද්ගලයෙකු ඉදිරිපත් නොවීම හේතුවෙන් දින හයක් පමණ රක්ෂිත බන්ධනාගාර ගතවීමට සිදුව ඇති බව තමාට දැන ගැනීමට ලැබුණු බව ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඔහුට අසාධාරණයක් සිදුවූ බවට ලිඛිත පැමිණිලි කර ඇති බවත්, එකී පැමිණිල්ල ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් කුරුණෑගල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත විමර්ශනයක් සිදුකරන ලෙස දන්වා තිබූ අතර, ඒ අනුව සහකාර පොලිස්පතිතුමිය විසින් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇති බවත් සඳහන් කර ඇත. එකී විමර්ශනයේදී තමා මේ සම්බන්ධයෙන් දැනුවත් වූ බව වැඩිදුරටත් සඳහන් කර ඇත. ඒ අනුව ප්‍ර.පො.ප. දසනායක මහතාගෙන් තමා මේ සම්බන්ධයෙන් විමසීම් කළ බවත්, මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු මාවතගම පොලිස් ස්ථානයේ අත්අඩංගුවට ගැනීමෙන් පසු දිවයිනේ අනෙකුත් පොලිසි ස්ථානවලට දුරකථන පණිවිඩ යොමුකර, ඇඟිලි සලකුනු ලබාගෙන ඒවා පරීක්ෂා කරන තෙක් අධිකරණයට ඉදිරිපත් කළ බව එම

නිලධාරියා විසින් තමා දැනුවත් කළ බව සඳහන් කර ඇත. තවද පැමිණිල්ලේ දක්වා ඇති පරිදි තමා 2024.04.20 දින පොලිස් ස්ථානයේ නිලධාරීන්ගේ ආරාධනයෙන් තමාගේ උපන්දිනය වෙනුවෙන් ඔවුන් විසින් සකස් කරන ලද කෙටි සාදය සඳහා ස්ථානයට පැමිණි අවස්ථාවේ, මෙම පැමිණිලිකරු සමග කිසිදු අවස්ථාවක කතා නොකළ බවත්, තමා එම පුද්ගලයාට බැණ වැදීමක් හෝ එම අයව සිරමැදිරියට දමන ලෙස නියෝග කිරීමක් හෝ සිදු නොකළ බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**පැමිණිල්ල සනාථ කිරීම :**

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත යොමුකරන ලද පැමිණිල්ල සනාථ කිරීම සඳහා, තමා පොලිස් ස්ථානයේ රඳවා තබාගෙන සිටින අවස්ථාවේ සිට තමාගේ ජාතික හැඳුනුම්පත තමා සන්තකයේ තිබූ බවත්, පොලිස් නිලධාරීන් විසින් තමාගේ අනන්‍යතාවය තහවුරුකර ගැනීමට නොහැකි වූ බැවින් තමා අත්අඩංගුවට ගත් බවට කරන ලද චෝදනාව වැරදි බව තහවුරු කිරීම සඳහා කොමිෂන් සභාව වෙත සාක්ෂි ඉදිරිපත් කර තිබේ. ඒ අනුව පැමිණිලිකරු 2024.04.21 දින අධිකරණය මගින් නියම කරන ලද ඇප කොන්දේසි සම්පූර්ණ කිරීමට නොහැකිවීම හේතුවෙන් දුම්බර බන්ධනාගාරයට යොමුකරන ලද අවස්ථාවේ තමා සන්තකයේ තිබී බන්ධනාගාරයට භාරදුන් බඩුබාහිරාදිය සම්බන්ධ ලැයිස්තුවක් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ බන්ධනාගාර අධිකාරීවරයාගෙන් ඉල්ලීමක් කර ලබාගෙන ඇති අතර එය මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමුකර ඇත. එකී ලිපියෙහි ඇක අංක 2872 යටතේ පැමිණිලිකරු වන පී. ඒ. පුෂ්පකුමාර යන අය සන්තකයේ ජාතික හැඳුනුම්පත ඇතුළුව තිබූ අනෙක් භාණ්ඩ සම්බන්ධ ලැයිස්තුවක් සටහන් කර ඇත. ඒ අනුව මෙම පැමිණිලිකරු 2024.04.19 දින පොලිස් ස්ථානයට පැමිණෙන අවස්ථාවේ සිට එම අය සතුව ජාතික හැඳුනුම්පත තිබී ඇති බව පෙනීයයි.

**විමර්ශනයේදී අනාවරණය වූ කරුණු :**

- පැමිණිලිකරු විසින් යොමුකර ඇති පැමිණිල්ලේ හා වගඋත්තර පාර්ශවයන් ලබාදී ඇති ප්‍රකාශ සහ වාර්තා අනුව 2024.04.19 වන දින මාවතගම පොලිස් ස්ථානය වෙත පවුල් හා භාණ්ඩ ආරවුලක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් පැය 23.45 ට පිටුව 371/ ඡේදය 144 පරිදි ගොනු කර ඇති බව නිරීක්ෂණය වේ. එකී පැමිණිල්ලේ පැමිණිලිකාරිය වන්නේ මෙම පැමිණිලිකරුගේ හිටපු පෙම්වතිය ලෙස සඳහන් කර ඇති නෙලුකා විජේරත්න යන අය වන අතර, එහි විත්ති පාර්ශවය ලෙස මෙම පැමිණිලිකරු එනම් පී. ඒ. පුෂ්ප කුමාර යන අය නම්කර ඇත. එකී පැමිණිල්ලෙහි උක්ත නම් දරණ පැමිණිලිකාරිය විසින් පී. ඒ. පුෂ්ප කුමාර යන අය (පැමිණිලිකරු) මාවතගම පොලිස් ස්ථානයට භාරදීමට ඔවුන් සමග රැගෙන ආ බවත් සඳහන් කර ඇත. එකී පැමිණිල්ලට අදාළව සාක්ෂි දෙකක් 2024.04.20 දින පෙ.ව. 12.10 සහ පෙ.ව. 12.25 ට සටහන් කර ඇති බව උද්ධෘත අනුව පෙනීයයි.
- එමෙන්ම පළමුවන වගඋත්තරකරුගේ ප්‍රකාශය අනුව පැමිණිලිකරු 2024.07.19 දින ඉහත නම් සඳහන් කාන්තාව සහ ඇයගේ ඥාතීන් සමග පොලිස් ස්ථානයට පැමිණ තිබුණු බවත්, පැමිණිලිකරු එම පිරිස පැමිණි වෑන් රථයේ සිටින බවට එම පිරිස පළමුවන වගඋත්තරකරු වෙත දැනුම්දුන් බවත්

සඳහන් කර තිබේ. ඒ අනුව ද 2024.04.19 දින පැමිණිලිකරු පොලිස් ස්ථානයට පැමිණ ඇති බව සනාථ වේ.

- 2024.04.20 දින දෙවන වගඋත්තරකරු වන මාවතගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති සිය උපන්දිනය නිමිත්තෙන් පොලිස් ස්ථානයේ සහෝදර නිලධාරීන් විසින් සංවිධානය කරන ලද කෙටි සාදය සඳහා එදින පෙ.ව. 11.00 පමණ පැමිණි බව ස්ථානාධිපතිවරයා විසින් ප්‍රකාශ කර ඇත. එමෙන්ම 2024.04.20 දින සවස 2.00 ට පමණ ස්ථානාධිපතිවරයා පොලිස් ස්ථානයට පැමිණි බව පැමිණිලිකරු ද ප්‍රකාශ කර ඇත. ඒ අනුව ඉහත ප්‍රකාශයන් දෙකේදී සඳහන් කර ඇති වේලාවන් වෙනස් වුවද, දෙවන වගඋත්තරකරු වන ස්ථානාධිපති නිශාන්ත හෙට්ටිආරච්චි මහතා 2024.04.20 දින පොලිස් ස්ථානයට දහවල් කාලයේ ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

- පළමුවන වගඋත්තරකරු වන ප්‍ර.පො.ප. ඩී. එම්. පී.කේ. දසනායක මහතා 2024.04.21 දින මෙම පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා යොමුකරන ලද බී.242/2024 දරණ ලේඛනයෙහි සඳහන්වී ඇත්තේ, "තමා 2024.04.20 දින මාවතගම, 09 කණුව, 04 කණුව, මල්ලවපිටිය, පිලැස්ස ආදී ප්‍රදේශවල සංචාරය කරමින් සිටියදී, මාවතගම නගරයේදී සැකකටයුතු ලෙස ගැවසෙමින් සිට තමා පැමිණි ජීප් රථය දැක මගහැර යාමට උත්සහා කළ පුද්ගලයෙකු තමා විසින් අල්ලාගෙන පරීක්ෂා කිරීමේදී, අනන්‍යතාවය තහවුරු කිරීමට කිසිදු ලේඛනයක් නොතිබීම හේතුවෙන් මෙම සැකකරු අපරාධයක් කිරීම සඳහා මාවතගම පොලිස් වසමට පැමිණියේද යන්න හා..... සැකපිට පැය 19.00 අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කරන ලදි" යනුවෙනි. එහෙත් පළමුවන වගඋත්තරකරු වන ප්‍ර.පො.ප. දසනායක මහතා විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබාදෙමින් සඳහන් කර ඇත්තේ, "තමා අදාළ සම්මන්ත්‍රණය අවසන්වී නැවත සවස පොලිස් ස්ථානයට පැමිණෙමින් සිටින විට මාවතගම නගරයෙහි බස් නැවතුම්පොළෙහි සැකකටයුතු පුද්ගලයෙකු සිටින බවට තමාගේ පුද්ගලික දුරකථනයට ඇමතුමක් තැබුණු බවත්, ඒ අනුව තමා එම ස්ථානයට ගොස් අදාළ සැකකාර පුද්ගලයාගෙන් ප්‍රශ්න කර ඔහුගෙන් ජාතික හැඳුනුම්පත ඉල්ලා සිටිය ද ඔහු සතුව හැඳුනුම්පත නොතිබූ බැවින් අත්අඩංගුවට ගත් බවත්" ය. ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කරන ලද බී වාර්තාවේ සඳහන් කරුණු සහ කොමිෂන් සභාවට ලබාදී ඇති ප්‍රකාශය අතර පරස්පරතාවයක් පවතින බව පෙනීයයි.

- තවද, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පළමුවන වගඋත්තරකරු විසින් 2024.04.21 දිනැතිව මාවතගම පොලිස් ස්ථානයේ පරිසර සටහන් පොතේ පිටුව 17/96 (ඡේදය) හි සටහන් යොදා ඇත්තේ, "තමා ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ සාකච්ඡාවට සහභාගී වී පොලිස් ස්ථානයට පැමිණීමේදී තමාට පුද්ගලික ඔත්තුකරුවෙකු විසින්, මාවතගම නගරයේ සැකකටයුතු පුද්ගලයෙකු සැරිසරන බවට දැනුම්දුන් බැවින්, තමා පැමිණි ජීප් රථය නුවර කුරුණෑගල මාර්ගයේ නවතා පා ගමනින් බස් නැවතුම් පොළට පැමිණි අතර, සැකකරු සිටි ස්ථානයට ගොස් බස්නැවතුම්පලේ රැඳී සිටීමට හේතුව විමසා බැලූ අතර...." යනුවෙනි. ඒ අනුව මෙම නිලධාරියා විසින් විභාග සටහන් වල යොදා ඇත්තේ තමා ජීප් රථය වෙනත් ස්ථානය නතර

කර පා ගමනින් මෙම සැකකරු සිටින ස්ථානයට ගිය බවයි. බී වාර්තාවේ දක්වා ඇත්තේ ජීප් රථය දැක මෙම සැකකරු මගහැර යාමට උත්සාහ කළ බවයි. ඒ අනුව පළමුවන වගඋත්තරකරු වන ප්‍ර.පො.ප. ඩී. එම්. පී.කේ. දසනායක නිලධාරියා විසින් ලබාදී ඇති මෙකී සියලුම ලිඛිත හා වාචික ප්‍රකාශ සටහන් එකිනෙකට පරස්පරවිරෝධී බව නිරීක්ෂණය වේ.

- 2024.05.27 දින අධිකරණයේ මෙම නඩුව කැඳවන ලද අවස්ථාවේදී දෙවන වගඋත්තරකරු වන මාවතගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් ගරු අධිකරණයට වැඩිදුර කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ, "මෙම සැකකරු සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශනය සිදුකර වාර්තා කිරීම සඳහා ඉදිරි දිනයක් ලබාදෙන ලෙසයි." එහෙත් 2024.07.12 දිනැතිව කොමිෂන් සභාව වෙත යොමුකරන ලද ලිඛිත වාර්තාවෙහි දක්වා ඇත්තේ, "2024.05.02 වන දින අධිකරණයේදී ඇප අසත්සන් කර සැකකරු ඇප මත මුදාහැර ඇත. නැවත 2024.05.27 දින නඩුව කැඳවීමෙන් පසු මෙම සැකකරුට විරුද්ධව චෝදනා නොමැති බව වාර්තාවීමෙන් පසු ඒ බව ගරු අධිකරණයට එදින වාර්තා කළ බවත්, එදින සැකකරු සම්බන්ධයෙන් අපරාධ චෝදනා ගොනු කිරීමට තරම් චෝදනා නොමැති බැවින් චූදිත මෙම නඩුවෙන් මුදාහැර නඩු කටයුතු අවසන් කර ඇති බවත්" සඳහන් කර ඇත. වගඋත්තර පාර්ශවය සඳහන් කරන පරිදි 2024.04.20 දින මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගත් පසු එම අය සම්බන්ධයෙන් අනෙකුත් පොලිස් ස්ථාන වලට පොලිස් පණිවිඩ යොමුකර, මොහුගේ ඇඟිලි සලකුණු වාර්තාවක් ලබාගැනීමට යොමුකර ඇත. 2024.04.21 දින පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ඉහත වාර්තා පොලිස් ස්ථානයට ලැබී ඇති අතර, එකී වාර්තා අනුව පැමිණිලිකරුට විරුද්ධව චෝදනා කිසිවක් නොමැති බවට තහවුරුවී තිබියදී, 2024.05.27 දින වැඩිදුර කරුණු දැක්වීමක් මගින් පැමිණිලිකරු සම්බන්ධයෙන් නැවත විමර්ශන කිරි බව වගඋත්තර පාර්ශවය විසින් අධිකරණයට දන්වා ඇත. ඒ අනුව චෝදනාවක් නොමැති බවට වාර්තාවී තිබියදී නැවත විමර්ශන කටයුතු සිදුකිරීමට ඉල්ලීම් කර ඇති බව පෙනීයයි.

**නිරීක්ෂණ :**

- පැමිණිලිකරුට විරුද්ධව එම අයගේ පෙම්වතිය බව කියන කාන්තාව විසින් 2024.04.19 දින මාවතගම පොලිස් ස්ථානයට මෙම අයට විරුද්ධව පැමිණිල්ලක් සිදුකර ඇති අතර, එදින එකී පැමිණිල්ල ඉදිරිපත් කිරීම සඳහා එම පැමිණිලි පාර්ශවයන් සමග පී. ඒ. පුෂ්ප කුමාර යන (පැමිණිලිකරු) අය ද මාවතගම පොලිස් ස්ථානයට ගොස් ඇති බව, උඳාත සටහන් නිරීක්ෂණයේදී පෙනීයයි. තවද පළමුවන වගඋත්තරකරු වන ප්‍ර.පො.ප. ඩී. එම්. පී.කේ. දසනායක මහතා ද පවුල් හා භාණ්ඩ ආරවුලක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට පැමිණිලි කාන්තාව හා පිරිස සමග එකී පැමිණිල්ලේ චූදිත ද පැමිණ ඇති බව තමාට දැනුම්දුන් බව ප්‍රකාශ කර තිබේ. ඒ අනුව 2024.04.19 දින මෙම පැමිණිලිකරු මාවතගම පොලිස් ස්ථානය වෙත ගොස් ඇති බව තහවුරු වේ.
- 2024.04.20 දින දෙවන වගඋත්තරකරු වන ප්‍ර.පො.ප. නිශාන්ත හෙට්ටි ආරච්චි මහතා සිය උපන්දිනය වෙනුවෙන් පොලිස් ස්ථානයේ නිලධාරීන් සූදානම් කරන ලද කෙටි සාදය සඳහා එදින පෙ.ව. 11.00 ට පොලිස් ස්ථානයට ගිය බව පිළිගෙන තිබේ. පැමිණිලිකරු විසින් ද 2024.04.20 දින

දෙවන වගඋත්තරකරු සවස 2.00 පමණ ඔම නිලධාරියාගේ උපන්දිනය උදෙසා සූදානම් කරන ලද කෙටි සාදය සදහා පැමිණි බව ප්‍රකාශ කර තිබේ. එදින දෙවන වගඋත්තරකරු ස්ථානයට පැමිණි වෙලාව සම්බන්ධයෙන් දෙපාර්ශවය ඉදිරිපත් කර ඇති වේලාවන් පරස්පර වුවද, මෙම නිලදාරියා එදින සවස 2.00 හෝ ඊට පෙර දහවල් කාලයේදී පැමිණ ඇති බව සනාථ වේ. එහෙත් පළමුවන වගඋත්තරකරු වන ප්‍ර. පො. ප. ඩී. එම්. පී.කේ. දසනායක නිලධාරියා විසින් මෙම පැමිණිලිකරු පැය 19.00ට අත්අඩංගුවට ගෙන ඇති අතර, ස්ථානයට ඉදිරිපත් කර උපසේවක වෙත භාරදුන් බවට උදෘතවල සටහන් කර ඇත්තේ එදින පැය 19.20 ට වේ. කරුණු එසේනම්, 2024.04.20 දින පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වන දෙවන වගඋත්තරකරුගේ උපන්දිනය වෙනුවෙන් ස්ථානයේ නිලධාරීන් පවත්වන ලද කෙටි සාදය සදහා එදින දහවල් ස්ථානාධිපති නිශාන්ත හෙට්ටිආරච්චි මහතා පොලිස් ස්ථානයට පැමිණි බව පැමිණිලිකරු දැක ඇත්තේ කෙසේද යන්න ගැටලු සහගත වේ. ඒ අනුව පෙනී යන්නේ ස්ථානාධිපති පොලිස් ස්ථානයට පැමිණෙන විටත් එනම් 2024.04.20 දින ප.ව. 2.00 හෝ ඊට පෙර වේලාවකදී පැමිණිලිකරු පොලිස් ස්ථානය තුළ සිට ඇති බවයි.

- 2024.04.20 දින පෙ.ව. 10.26 ට මෙම පැමිණිලිකරුගේ පෙම්වතිය විසින් ඊට පෙර දින ගොනුකරන ලද පැමිණිල්ල ළමා හා කාන්තා කාර්යාංශයේ කා. ප්‍ර. පො. ප. ශාන්ති නිලධාරිනිය විසින් විභාග කර, දෙපාර්ශවය සමතයකට පත් කර ඇති බවට පැමිණිලි තොරතුරු සටහන් II පොතෙහි පිටුව 381/ 150 යටතේ සටහන් කර ඇත. ඉහත දක්වා ඇති පරිදි දෙපාර්ශවය සමතයකට පත් වූවා නම් මෙම පැමිණිලිකරු තවදුරටත් සිය කැමැත්තෙන් පොලිස් ස්ථානයේ රැදී සිටීමට කිසිදු හේතුවක් නොමැති බව නිරීක්ෂණය වේ.
- මෙම කරුණු අනුව, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට සාධාරණ හේතුවක් තිබී ඇති බව පෙනීනොයන බැවින්, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කරන ලද 13 (1) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. තවද පැමිණිලිකරු සාධාරණ හේතුවකින් තොරව අත්අඩංගුවට ගෙන 2024.04.19 දින රාත්‍රියේ පැය 23.45 සිට 2024.04.21 දින පෙ.ව. 10.30 ට අධිකරණයට ඉදිරිපත් කරන තෙක් මෙම පැමිණිලිකරු පොලිස් ස්ථානයේ පැය 34 යි විනාඩි 45 ක පමණ කාලයක් රඳවා තබාගෙන සිටීම තුළනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කරන ලද 13 (2) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාවට කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. ඒ අනුව අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු අධිකරණය නියෝගයකින් තොරව පොලිස් ස්ථානයේ රඳවා තබාගැනීමේ හැකියාව ඇත්තේ උපරිම පැය 24 ක කාල පරිච්ඡේදයකි. එකී නීතිය පිළිබඳව දැනුවත්ව සිටින වගකිව යුතු පොලිස් නිලධාරීන් විසින් නීත්‍යානුකූල රාමුවෙන් බැහැරව යමින් මෙම පැමිණිලිකරු පොලිස් ස්ථානයේ රඳවා තබාගනිමින්, 2024.04.20 දින පැය 19.00 අත්අඩංගුවට ගත් බවට සාවද්‍ය ලෙස වාර්තා කර ඇති බව පෙනීයයි.
- තවද පැමිණිලිකරු 2024.04.19 වන දින රාත්‍රී පැය 23.45 පමණ පොලිස් ස්ථානයට ගිය පසු 2024.04.21 දින පෙ.ව. 10.30 ට පමණ අධිකරණය ඉදිරිපත් කර බන්ධනාගාර ගත කරන තෙක් පැමිණිලිකරු හමුවීමට ඔහුගේ හිතවතෙකු හෝ ඥාතියෙකු පැමිණ නොමැති බවට පැමිණිලිකරු

විසින් සිය පැමිණිල්ල සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සාක්ෂි අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකරුගේ ජාතික හැඳුනුම්පත 2024.04.19 දින පොලිස් ස්ථානයට පැමිණෙන අවස්ථාවේ සිට පැමිණිලිකරු සන්තකයේ තිබී ඇති බවත් කිසිදු බාහිර පාර්ශවයක් විසින් පැමිණිලිකරු අත්අඩංගුවේ සිටින විට ඔහුගේ ජාතික හැඳුනුම්පත ඔහු වෙත ලබාදීමට අවස්ථාවක් තිබී නොමැති බව පෙනීයයි. එසේ ජාතික හැඳුනුම්පත තිබියදී පළමු වන වගඋත්තරකරු වන . පො. ප. ඩී. එම්. පී.කේ. දසනායක නිලධාරියා විසින් අනන්‍යතාවය තහවුරු කිරීමට කිසිදු ලේඛනයක් නොතිබූ බව සඳහන් කරමින් පැමිණිලිකරු අත්අඩංගුවට ගත් බවට සාවද්‍ය ලෙස සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව ව්‍යාජ චෝදනා යටතේ මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇති බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක 323/2017 දරණ “ගනේශන් සැම්සන් රෝයි එදිරිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව” නැමති නඩුවේදී, නිසි විමර්ශනයකින් තොරව සැම්සන් රෝයි නැමති පුද්ගලයා රුපියල් මිලියන හතකට ආසන්න මුදල් ප්‍රමාණයක් වංචා කළ බවට ව්‍යාජ චෝදනා ගොනුකරමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් 2023.05.09 දින තීන්දුවක් ලබාදෙමින් සඳහන් කර ඇත්තේ, “එකී අත්අඩංගුවට ගැනීම නීතිවිරෝධී බවත්, අදාළ චෝදනා සත්‍යදැයි පරීක්ෂා කිරීමකින් තොරව පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වන බවත්” ය. ඒ අනුව වගඋත්තර පාර්ශවය විසින් වින්දිත පාර්ශවය වෙත මූල්‍ය වන්දියක් ලබාදිය යුතු බවට මෙම නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝග කර තිබේ. ඒ අනුව මෙම නඩු තීන්දුවෙන් ද පෙනීයන්නේ, ව්‍යාජ චෝදනා ගොනුකරමින් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම නීති විරෝධී බවයි.

**නිගමනය :**

පී. ඒ පුෂ්පකුමාර යන අය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනුකර ඇති පැමිණිල්ල සම්බන්ධයෙන්, පැමිණිලිකරු හා වගඋත්තර පාර්ශවය ඉදිරිපත් කර ඇති සියලු ලිඛිත හා වාචික සාක්ෂි සලකා බලා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පහත නිගමනවලට එළඹ තිබේ.

පැමිණිලිකරු සන්තකයේ ජාතික හැඳුනුම්පත තිබියදී, “අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා කිසිදු ලේඛනයක් නොතිබීම හේතුවෙන් අපරාධයක් කිරීම සඳහා මාවතගම ප්‍රදේශයට පැමිණියේද යන්න හා අපරාධයක් සිදුකර සැඟවී සිටීමට මෙම ප්‍රදේශයට පැමිණියේද යන්න සැකපිට ප්‍රශ්න කිරීම සඳහා අත්අඩංගුවට ගත්බව” බී වාර්තාවේ සඳහන් කරමින් මෙම අය අත්අඩංගුවට ගෙන ඇති බැවින්, මෙම අත්අඩංගුවට ගැනීම නීති විරෝධී බවට කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව **පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13 (1)** ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති **“කිසිම පුද්ගලයෙකු නීතිය මඟින් දක්වා ඇති ආකාරයට මිස කිසි පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම සිදු නොකළ යුතුය. යම් පුද්ගලයකු අත්අඩංගුවට ගන්නේ නම් අත්අඩංගුවට ගැනීමේ හේතුව එම පුද්ගලයාට දන්වා සිටිය**

**යුතුය" යන මූලික අයිතිවාසිකම පළමුවන වගඋත්තරකරු ප්‍ර. පො.ප. එම්. පී.කේ. දසනායක මයා විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.**

එමෙන්ම, ඉදිරිපත්වී ඇති සියලුම සාක්ෂි අනුව පැමිණිලිකරු 2024.04.19 දින රාත්‍රියේ සිට මාවතගම පොලිස් ස්ථානයේ අත්අඩංගුවේ සිට ඇති අතර, 2024.04.21 දින අධිකරණයට ඉදිරිපත් කරන තෙක් පැය 34 යි විනාඩි 45 කට ආසන්න කාලයක් පොලිස් ස්ථානය තුළ නීති විරෝධී ආකාරයෙන් රඳවා තබාගෙන සිට ඇති බව තහවුරු වේ. නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා බැඳී සිටින නිලධාරීන් විසින් නීත්‍යානුකූල රාමුව අභිබවනය කරමින් කටයුතු කර ඇති බව මෙයින් පෙනීයයි.

ඒ අනුව **පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13 (2) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති "අත්අඩංගුවෙහි තබාගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තෙකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්යය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස, ඒ තැනැත්තා තවදුරටත් අත්අඩංගුවෙහි තබාගැනීම හෝ රඳවා තබාගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේය." යන මූලික අයිතිවාසිකම පළමුවන වගඋත්තරකරු ප්‍ර. පො.ප. එම්. පී.කේ. දසනායක මයා සහ දෙවන වගඋත්තරකරු ස්ථානාධිපති නිශාන්ත හෙට්ටිආරච්චි මයා විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.**

තවද, මාවතගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත හෙට්ටිආරච්චි මහතා මෙම සිදුවීම වන කාලසීමාවේදී නිවාඩු ලබාතිබුණ ද, එම නිලධාරියාගේ උපන්දිනය සැමරීම සඳහා පොලිස් ස්ථානයේ නිලධාරීන් සංවිධානය කර තිබූ කෙටි සාදය සඳහා 2024.04.20 දින එනම් පැමිණිලිකරු පොලිස් ස්ථානයේ සිටිය දී පැමිණ ඇති අතර, ඒවන විටත් පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන සිටිය ද, නීත්‍යනුකූලව රඳවා තබාගැනීම සම්බන්ධයෙන් ලේඛනගත කිරීමක් සිදුකර නොමැති බවට දැනුවත්ව, ඒ සම්බන්ධයෙන් ස්ථානභාර අධීක්ෂණ නිලධාරියා වශයෙන් ඔහුගේ නීතිමය වගකීම් නිසි ලෙස ඉටුනොකිරීම හේතුවෙන්, **පැමිණිලි පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යස්ථාව මඟින් තහවුරු කර ඇති "නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම, දෙවන වගඋත්තරකරුවන ප්‍ර.පො.ප. නිශාන්ත හෙට්ටිආරච්චි මහතා විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් තීරණය කරනු ලැබේ.**

ඉහත නිගමන අනුව වගඋත්තර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) සහ 13 (1) හා (2) ව්‍යවස්ථාවන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන නිර්දේශ නිකුත් කරනු ලැබේ.

<u>**පොලිස්පතිවරයා විසින්,**</u>

1) පළමුවන වගඋත්තරකරු වන ප්‍ර.පො.ප. එම්. පී. කේ. දසනායක නිලධාරියා මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම හා රඳවා තබාගැනීම සම්බන්ධයෙන් නීත්‍යානුකූල රාමුවෙන් පරිබාහිරව ක්‍රියා කර ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු වේ.

2) මාවතගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වන දෙවන වගඋත්තරකරු නිශාන්ත හෙට්ටිආරච්චි මයා ස්ථානයේ අධීක්ෂණ භාර නිලධාරියා වශයෙන් ක්‍රියාකර ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂා කොට සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු වේ.

(2026) 2025. 02.18 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතුය.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

1) අමාත්‍යතුමා, - කාරුණික දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

2) ලේකම්, - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

3) පොලිස්පති, - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීම සඳහා
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

4) සභාපති, - අවශ්‍ය කටයුතු සඳහා
ජාතික පොලිස් කොමිෂන් සභාව, කොළඹ 07.